# උත්ථාන සමයේ සතරවන සතිය
# සිකුරාදා

## පළමුවන කියැවීම

අපෝස්තුළුවරුන්ගේ ක්‍රියාපොතෙන් ගත් පාඨයෙකි ක්‍රියා 13 : 26–33

**"දෙවියන් වහන්සේ අපේ පියවරුන්ට දුන් පොරොන්දුව ජේසුස් වහන්සේ උත්ථාන කිරීමෙන් ඉටු කළ සේක."**

"සහෝදරයනි, ආබ්‍රහම්ගේ වංශයේ පුත්‍රයෙනි, දේව භය ඇති සියල්ලෙනි, මේ ගැළවීමේ පණිවුඩය ඔබ සඳහා ය. කවර හෙයින් ද? ජනතාවත් ඔවුන්ගේ පාලකයනුත් උන්වහන්සේ ගැන තේරුම් නොගත්තත්, උන්වහන්සේ වරදට පත් කිරීමෙන් සත්තකින්ම කළේ සෑම සබත් දිනකදීම අප විසින් කියවනු ලබන දිවැස් වැකි සම්පූර්ණ කිරීම ය. උන්වහන්සේ අතරෙන් මරණයට සුදුසු කිසිවක් සොයා ගත නොහැකි වූ නමුත් උන්වහන්සේ මරණයට පත් කරන ලෙසට ඔව්හු පිලාත්ගෙන් ඉල්ලූහ. මෙසේ උන්වහන්සේ ගැන ලියා තිබුණු සියල්ල සම්පූර්ණ කළ විට ඔව්හු උන්වහන්සේ කුරුසියෙන් බා සොහොන් ගෙයක තැන්පත් කළහ. එහෙත් දෙවියන් වහන්සේ උන්වහන්සේ උත්ථාන කළ සේක. උන්වහන්සේ තමන් සමඟ ගලීලයේ සිට ජෙරුසලමට පැමිණි අයට බොහෝ දවසක් දර්ශනය වූ සේක. ඔව්හු දැන් ජනතාව ඉදිරියෙහි සාක්ෂිකාරයෝව සිටිති. එබැවින් දෙවියන් වහන්සේ පියවරුන්ට දුන් පොරොන්දුව ජේසුස් වහන්සේ උත්ථාන කිරීමෙන් අපේ දරුවන්ට ඉෂ්ඨ කළ සේක" යන සුබ අස්න ඔබ වෙත ගෙනෙමු.

ඒ බව, ඔබ මාගේ පුත්‍රයාණෝ ය,<br>
අද මම ඔබ ජනිත කළෙමි" යි

දෙවන ගීතයෙහි ලියා තිබේ.

දේව වාක්‍යය එසේය.

# පිළිතුරු ගීය

ගීතාවලිය 2 : 6 – 11

පිළිතුර: නුඹ මාගේ පුත් කුමරු ය. අද මම ඔබේ පිය රජු වූයෙමි.

ගීය:

මගේ ශුද්ධ සියොන් ගිර මත්තෙහි මා රජිඳු හට කිරුළු පළඳවා රජකම දුන්නෙමි. මම දේව නියෝගය ප්‍රකාශ කරන්නෙමි.
එතුමාණෝ මට කතා කොට, "නුඹ මාගේ පුත් කුමරු ය. අද මම ඔබේ පිය රජු වූයෙමි.

නුඹ කැමැති දෙයක් මාගෙන් අයදින්න. සකල ජාතීහු නුඹ උරුමය වන්නෝය. මුළු මහ පොළොව ද නුඹ සන්තක වන්නේය. නුඹ දරදඬු පාලනයකින් ඔවුන් සිඳ බිඳ, මැටි බඳුනක් සේ සුණු විසුණු කර ඇතැ" යි වදාරන සේක.

රජවරුනි, ඒ නිසා සිහි පරීක්ෂාකාරීව සිටින්න.
භූපතිවරුනි, මෙයින් ගුරුකම් සිතට ගන්න.
සමිඳුන් හට ගරු බියෙන් සේවය කරන්න.

# සාධුකාරය

ආලේලූයා! ආලේලූයා!
"ඔබ ක්‍රිස්තුස් වහන්සේ සමග උත්ථාන කරනු ලැබූ බැවින්
ක්‍රිස්තුස් වහන්සේ වැඩ සිටින තැන ඇති
ලොව්තුරු දේ ප්‍රාර්ථනා කරන්න."
ආලේලූයා!

# සුවිශේෂය

සුවිශේෂක ජුවාම් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

ජුවාම් 14:1–6

**“මාර්ගය ද සත්‍යය ද ජීවනය ද මම වෙමි.”**

“ඔබේ සිත් නොකැළඹේවා, දෙවියන් වහන්සේ අදහා ගන්න. මා ද අදහා ගන්න. මාගේ පියාණන් වහන්සේගේ නිවාසයෙහි බොහෝ වාසස්ථාන ඇත. එසේ නොවේ නම් ඒ බව මම ඔබට නොකියමි ද? ඔබට ස්ථානයක් සූදානම් කරන පිණිස යමි. මා ගොස් ඔබට ස්ථානයක් සූදානම් කළ විට මා සිටින තැන ඔබත් සිටින පිණිස ඔබ කැඳවාගෙන යාමට මම නැවත එන්නෙමි. මා යන ස්ථානයට මාර්ගය ඔබ දන්නහු ය” යි වදාළ සේක. තෝමස් කතා කොට “ස්වාමිනි, ඔබ කොතැනකට වඩින සේක් දැයි අපි නොදනිමු. එසේ නම් මාර්ගය දැනගන්නේ කෙසේදැ” යි ඇසීය. ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින්, “මාර්ගය ද සත්‍යය ද ජීවනය ද මම වෙමි. මා මගින් මිස කිසිවෙක් පියාණන් වහන්සේ වෙත නොපැමිණෙන්නෝ ය” යි වදාළ සේක.

සුවිශේෂ වාක්‍යය එසේය.